# ජාතික මෝස්තර මධ්‍යස්ථානය

විශ්ව ගම්මානයේ වෙළඳ ලෝකය ජයගැනීම අප හමුවේ ඇති ප්‍රබල අභියෝගයකි. පාරම්පරික කලා ශිල්ප අභාවයට යා නොදී රැකගන්නා අතර, තරඟකාරී වෙළඳපොළට ගැලපෙන පරිදි ග්‍රාමීය හස්ත කර්මාන්ත භාණ්ඩ වල මෝස්තරද, වෙළඳපොළ අවශ්‍යතාවන්ට අනුව කාලානුරූපීව වෙනස්කළ යුතු විය. ලංකා ජාතික මෝස්තර මධ්‍යස්ථානය පිහිටුවන ලද්දේ මෙම අභියෝගය ජයගැනීමට අපගේ හස්තකර්මාන්ත ශිල්පීන්ට අනදීමටය.

## අපගේ අරමුණ

මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණ වනුයේ ග්‍රාමීය හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිෂ්පාදන නව වෙළඳපොළ ප්‍රවනතාවයන්ට ගැලපෙන පරිදි සංවර්ධනය කිරීමත්, නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නව තාක්ෂණය හඳුන්වාදීමත්, ඒ සඳහා අවශ්‍යකරන තාක්ෂණික හා ශිල්පීය පුහුණුව ලබාදීමත්, නිෂ්පාදනය සඳහා නව මෝස්තර නිර්මාණ හඳුන්වාදීමත්, තොරතුරු සහ අලෙවි ප්‍රවර්ධන සේවාවන් ලබාදීම තුලින් හස්ත කර්මාන්ත සඳහා දේශීය හා අපනයන අලෙවි අවස්ථාවන් වැඩි දියුණු කිරීම මගින් ශිල්පීන්ගේ ජීවන තත්වය උසස් කිරීම සහ ඒ ආශ්‍රිතව ස්වයංරැකියා අවස්ථාවන් වර්ධනය කිරීමට සහාය ලබාදීමත් වේ.

## අපගේ සේවාවන්

පාරම්පරික අත්කම් භාණ්ඩවල තත්වය නඟාසිටුවීමත්, කාලානුරූපී අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි අතීතයේ පැවති හා වර්තමානයේ පවතින විවිධ මෝස්තර නිර්මාණයන්හි නිර්මාණාත්මක භාවය වෙළඳපොළ අවශ්‍යතාවයන්ට අනුව වැඩි දියුණු කිරීම තුලින් එම කලා ශිල්ප අභාවයට යා නොදී රැකගැනීමත්, වෙනස්වන වෙළඳපොළ හා පාරිභෝගික රුචිකත්වය අධ්‍යයනය කිරීම තුලින් එම අවශ්‍යතාවයන්ට අනුව නව මෝස්තර නිර්මාණ බිහි කිරීම සහ දැනට නිෂ්පාදනය කෙරෙන නිර්මාණවල කලාත්මකභාවය වර්ධනය කිරීම සඳහා මෝස්තර නිර්මාණ උපදෙස් ලබාදීමත්, මූලාදර්ශ සංවර්ධනය කිරීමත් ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන සේවාවකි.

## පර්යේෂණ හා සංවර්ධන සේවාවන්

මෙම ආයතනය විශ්ව විද්‍යාල, කාර්මික තාක්ෂණික ආයතනය ( ITI ), විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ( PGIS ) ආදි විද්‍යාත්මක හා තාක්ෂණික ආයතන සමග සම්බන්ධවී පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් පවත්වාගෙන යාම තුලින්, හස්ත කර්මාන්ත සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය වඩා උසස් තත්වයෙන් හා නවීන ක්‍රමවලට අනුව පිළියෙළ කරගැනීමටත්, හස්ත කර්මාන්ත සඳහා භාවිතා කළ හැකි නව අමුද්‍රව්‍ය සහ වර්ණ, ග්ලේස් වර්ග හඳුනා ගැනීම තුලින් වඩා උසස් ප්‍රමිතියකින් යුතු භාණ්ඩ නිෂ්පාදනය කිරීමට නිෂ්පාදකයින් දැනුවත් කිරීමටත් සහාය වෙයි. මෙම සේවාව වඩාත් ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා මෙම මධ්‍යස්ථානයේ මහනුවර, නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය ආශ්‍රිතව කුඩා පරිමාණයේ විද්‍යාගාරයක් ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

## තාක්ෂණික සංවර්ධන සේවාවන්

තාක්ෂණික සංවර්ධන සේවාවන් යටතේ හස්ත කර්මාන්ත නිෂ්පාදකයින්ගේ ප්‍රායෝගික නිෂ්පාදන ගැටළු හඳුනාගෙන පර්යේෂණවල යෙදීමේ ප්‍රතිඵලයක් ලෙස එම නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන කටයුතු වඩා කාර්යක්ෂමව ඉටු කිරීමට හා මනා නිමාවකින් හා උසස් ප්‍රමිතියකින් යුතු භාණ්ඩ නිෂ්පාදනය කිරීම සහ නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණු කරගැනීම සඳහා අවශ්‍ය නව තාක්ෂණික ක්‍රම, වඩා යෝග්‍ය මෙවලම් හා උපකරණ හඳුන්වා දෙනු ලැබේ.

## ග්‍රාමීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන ආරම්භ කිරීම

මෙම වැඩපිළිවෙල යටතේ 2001 වසර තුල දිවයිනේ දිස්ත්‍රික් 08 ක් ආවරණය වන පරිදි, ග්‍රාමීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන 08 ක් ආරම්භ කිරීමට මූලික කටයුතු ආරම්භකර ඇත. ජාතික ශිල්ප සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය යන ආයතන මගින් හස්ත කර්මාන්ත ශිල්පීන්ට ලබාදෙන සේවාවන් මෙම මධ්‍යස්ථාන හරහා ලබාදීමටත්, විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන මගින් පුහුණුව ලබාගත් තරුණ කොටස් සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සහාය සේවාවන් ලබාදීමේ මධ්‍යස්ථාන ලෙසත් මේවා පවත්වාගෙන යාමට බලාපොරොත්තු වේ.

තවද, මෙම සේවා මධ්‍යස්ථාන හරහා තම නිෂ්පාදන ක්‍රියාවලියේදී අවශ්‍යවන නව තාක්ෂණික මෙවලම් හා උපකරණ හඳුනා ගැනීමටත්, ඒවා භාවිතය සම්බන්ධයෙන් අවශ්‍ය පුහුණුව ලබාගෙන තම නිෂ්පාදන කටයුතු සඳහා අදාල තාක්ෂණික මෙවලම්/උපකරණ ආදිය භාවිතා කිරීමටත්, හස්ත කර්මාන්ත ශිල්පීන්ට අවස්ථාව සැලසේ.

## හම් කර්මාන්තය සඳහා විශේෂ සේවාවන්

සම් භාණ්ඩ නිෂ්පාදනයේදී අවශ්‍ය කරන විවිධ මෙවලම් හා උපකරණ භාවිතාකර නිෂ්පාදකයින්ට නිෂ්පාදන කටයුතු කරගැනීමට පහසුකම් සලසා දෙනුවස්, 1992 දී නත්තතරම් පොත ව්‍යාපෘති කාර්යාලය සහ වැඩහල ආශ්‍රිතව පොදු පහසුකම් මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. එමගින් ආශ්‍රිත නිෂ්පාදනවල යෙදෙන ශිල්පීන්ට උසස් නිමාවකින් යුතු භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කළ හැකි විවිධ නව මෙවලම්, උපකරණ හා යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදෙන අතර, එම මෙවලම්, උපකරණ හා යන්ත්‍රසූත්‍ර නව නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කිරීමටද පහසුකම් සලසා ඇත.

## උසස් ශිල්පීය පුහුණුව ලබාදීම

හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ හැකියාවන් වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර රාශියක් සඳහා ප්‍රායෝගික වැඩමුළු සංවිධානයකර පැවැත්වීම ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන සේවාවකි. මෙම ආයතනයේ මොරටුව හා නත්තරම්පොත පිහිටි ව්‍යාපෘති කාර්යාලවල වැඩහල් මගින් ද, ගම් මට්ටමින්ද විවිධ ප්‍රදේශවල රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඇතිව දේශීය හා විදේශයන්හි පුහුණුව ලැබූ උපදේශකවරුන් මගින් ප්‍රායෝගිකව වැඩමුළු මෙහෙයවනු ලැබේ. ග්‍රාමීය ප්‍රදේශවල බහුල ද්‍රව්‍යමය සම්පත් සහ එම ප්‍රදේශවල වෙසෙන හස්ත කර්මාන්ත නිෂ්පාදකයින්ගේ හැකියාවන් හඳුනාගෙන ඒ ආශ්‍රයෙන් විවිධ අමුද්‍රව්‍ය භාවිතය තුළින් උසස් නිමාවකින් යුතු නව නිර්මාණ වානිජ මට්ටමින් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදීමත් , පර්යේෂණ මගින් හඳුනා ගන්නා විවිධ නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීමත් මෙම පුහුණු වැඩමුළු මගින් සිදු කෙරේ.

## අලෙවි ප්‍රවර්ධන සේවා, තොරතුරු හා පුස්තකාල සේවා සැපයීම

හස්ත කර්මාන්ත ශිල්පීන් දේශීය සහ අපනයන වෙළඳපොළ අවශ්‍යතාවයන් පිළිබඳව දැනුවත් කිරීම සහ නිෂ්පාදකයින් සහ ගැණුම්කරුවන් අතර, වඩා හොඳ සම්බන්ධතාවයක් ගොඩනැගීම මෙම සේවාවේ මූලික අරමුණයි. මේ සඳහා වාර්ෂිකව හස්ත කර්මාන්ත ශිල්පීන් සහ ඔවුන්ගේ නිර්මාණ දේශීය හා විදේශීය හස්ත කර්මාන්ත ගැණුම්කරුවන්හට හඳුන්වාදීමට කටයුතු කෙරේ. හස්ත කර්මාන්ත නිෂ්පාදකයින්ගේ හමු පැවැත්වීම තුළින් ගැණුම්කරුවන්ගේ විවිධ අවශ්‍යතාවයන්ට අනුව තම නිෂ්පාදනයන් සංවර්ධනය කරගැනීමට උපදෙස් හා සේවාවන් නිෂ්පාදකයින් වෙත ලබාදෙනු ලැබේ. තවද, හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නව නිර්මාණ වෙළඳපොළ රුචිකත්වයට ගැලපෙන අයුරින් නිෂ්පාදනය කිරීමේදීද වැඩි ඉල්ලුමක් ඇති භාණ්ඩ සම්බන්ධයෙන් තොරතුරු සහ විවිධ වෙළඳපොළ තොරතුරු එක්රැස් කිරීම සහ ප්‍රකාශණය, සම්මන්ත්‍රණ මගින් ඒවා බෙදා හැරීමද සිදු කරනු ලැබේ. හස්ත කර්මාන්තකරුවන්ගේ නව නිර්මාණ සඳහා වෙළඳපොළ සමීක්ෂණ කටයුතු හා අලෙවි පර්යේෂණ සිදු කිරීම සහ ඊට අමතරව දේශීය සහ විදේශීය රටවල පැවැත්වෙන විවිධ හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය සහ සල්පිල් සඳහා නව නිර්මාණ යොමු කිරීම තුළින් දේශීය හස්ත කර්මාන්ත නිෂ්පාදකයින්හට අනදීමද සිදු කෙරේ.

දේශීය හා විදේශීය පොත්පත්, සඟරා සහ වෙළඳ ප්‍රකාශන අඩංගු විශේෂ පුස්තකාලය මගින් නව ශිල්පීය තාක්ෂණය නිෂ්පාදනය, අලෙවිය සහ කළමණාකරණය පිළිබඳ දේශීය සහ විදේශීය තොරතුරු පරිශීලනය කිරීම සඳහා නිෂ්පාදකයින්ට අවස්ථාව සලසා ඇත. තවද හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ සියළුම තොරතුරු අඩංගු පරිගණක දත්ත බැංකුවක්ද, පවත්වාගෙන යන අතර, එමගින් මෙම ක්ෂේත්‍රයේ නියැලී සිටින්නන්හට අවශ්‍ය අවස්ථාවන්හිදි අදාල තොරතුරු ලබාගැනීමට අවස්ථාව සලසා ඇත.

ශ්‍රී ලාංකික හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ තොරතුරු ඇතුළත් ජාතික නාමාවලියක් ප්‍රකාශයට පත් කරන ලද අතර, මෙම ප්‍රකාශනය 2001 වසර සඳහා යාවත්කාලීන කොට නැවත මුද්‍රණය කිරීමටද, කටයුතු සලසා ඇත. අලෙවි ප්‍රවර්ධන සහායකයක් ලෙස පිළියෙල කරන ලද මෙම ප්‍රකාශනය විදේශීය තානාපති කාර්යාල, වෙළඳ ප්‍රවර්ධන ආයතන, රාජ්‍ය ආයතනවලට මෙන්ම හස්ත කර්මාන්ත අපනයනකරුවන්ට හා දේශීය ගැණුම්කරුවන්ට බෙදා හැරීමට කටයුතු කිරීම මගින් ඔවුන්ට දේශීය හස්ත කර්මාන්ත ශිල්පින්ගේ තොරතුරු ලබාගත හැකිවේ. ඒ මගින් දේශීය හා අපනයන වෙළඳපොළ අවස්ථාවන් ලබා දීමට අදහස් කෙරේ.

## පිරි නිර්මාණ පර්යේෂණවල යෙදෙන උපාධි අපේක්ෂකයින්ට අවශ්‍ය සහාය ලබාදීම සහ උපදේශන සේවා සැපයීම


සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ පිරි නිර්මාණ අධ්‍යයනය ලබන උපාධි අපේක්ෂකයින්ට සහ උසස් අධ්‍යාපනයේ යෙදෙන ශිෂ්‍යයින්ට ඔවුන්ගේ නිර්මාණාත්මක පර්යේෂණ කටයුතුවල යෙදීමට අවශ්‍ය උපදේශක සේවාවන් මෙම ආයතනය මගින් ලබා දේ.

පිරි නිර්මාණ විෂය අධ්‍යාපනය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නන් සඳහා සහ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නිපුන ශිල්පීන්ට වෘත්තීය සුදුසුකමක් ලබාදීමේ අරමුණ ඇතිව ආරම්භකර ඇති ඩිප්ලෝමා පාඨමාලාවේ පාඨමාලා කාලය වසර 03 කි. මෙම ආයතනයේ මොරටුව ව්‍යාපෘති කාර්යාලය ආශ්‍රිතව පැවැත්වෙන

මෙම පාඨමාලාවේ අවසාන භාගයේදී සිසුන්ව වෘත්තිය පුහුණුව සඳහා යොමු කරනු ලැබේ. අවසන් පරීක්ෂණය සමත්වන සිසුන් සඳහා පමණක් ඩිප්ලෝමා සහතික පත් පිරිනමනු ලැබේ. මීට අමතරව සහතිකපත් පාඨමාලාවක් ලෙස මෙම ආයතනයේ නන්තරම්පොන ව්‍යාපෘති කාර්යාලය ආශ්‍රිතව පැවැත්වෙන කලා හා කලා ශිල්ප පදනම් පාඨමාලාවේ කාලසීමාව වසරකි.

## රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා නිර්මාණාත්මක උපදේශක සේවා සැපයීම

රාජ්‍ය සහ වෙනත් අදාල ආයතන වලින් විවිධ අවස්ථාවන්හිදී සිදු කරනු ලබන ඉල්ලීම් වලට අනුව නිර්මාණාත්මක කාර්යයන් සඳහා ( අභ්‍යන්තර සැරසිලි, සම්මාන සහ තිළිණ ආදිය) අවශ්‍ය උපදේශක සේවාවන් සපයනු ලැබේ.



### වැඩි විස්තර සඳහා

ප්‍රධාන ාකාර්යාලය,
ශ්‍රී ලංකා ජාතික මෝස්තර මධ්‍යස්ථානය,
3, වන මහල, වැලිකඩ ප්ලාසා,
වැලිකඩ, රාජගිරිය.

සභාපති - දුරකථන 883541
අධ්‍යක්ෂ - දුරකථන 883542
ප්‍රධාන කාර්යාලය - දුරකථන 883543
883544

ෆැක්ස් : 883542
ඊමේල් : slndcnet@sltnet.lk
වෙබ් අඩවිය : www.srilanka yellowpages.com/slndc

***(ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සපයන ලද තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)***

## New, simple methods for storing soybean seeds

The World Vegetable Centre (AVRDC) has successfully developed methods for maintaining soybean seeds viability when stored.

In developing countries, a major constraint to soybean production is the rapid loss of seeds quality in storage. Faced with this challenge, AVRDC scientists conducted a series of experiments to develop improved storage techniques. They immediately noticed that seeds from fully mature, brown pods maintained their quality in storage much better than seeds from less mature, yellow pods. After storage, the scientists found that soybean varieties with smaller sized seeds germinated best. This was expected, as larger seeds are more difficult to dry after harvesting. Smaller-seeded legumes such as mung-bean and black gram generally store much better than soybean.

Six drying treatments were tested: baked limestone, ash, rice husk charcoal, baked salt, magnesium sulphate, and none. The desiccants were placed in the bottom of a sealed container and stored under room temperatures, 25-30$^{0}$C.

Scientists determined that among the desiccants, baked limestone was the best. It lowered seed moisture levels down to two per cent after one month and kept moisture levels down to eight per cent after five months. Most importantly, nearly all seeds germinated after six months of storage. Since limestone is inexpensive and readily available, it looks like the perfect technology for small-scale soybean farmers in the tropics to store their seeds.

Based on such encouraging results, AVRDC scientists are now working to develop practical, large-scale methods of storing soybean seeds using baked limestone.

For more information contact AVRDC, PO Box 42, Shanhuna, Tainan 741; Taiwan Republic of China.
Tel: +886-6-6-583-7801;
Fax: +886-6-583-0009; email: avrdc@avrdc.org